# 14 පටිච්ච සමුප්පාද න්‍යාය හැඳින ගනිමු

අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේ පළමුව පැවිදි වී සිටියේ සංජය පිරිවැජිතුමන්ගේ ශිෂ්‍යවරයකු ලෙස ය. එකල එතුමන් හැඳින්වුණේ උපතිස්ස යන නාමයෙනි. තමන් සොයන සැනසීම පරිව්‍රාජක දහමින් නොලැබෙන බව වටහා ගත් උපතිස්ස පිරිවැජිතුමා තම කලණ මිතුරු කෝලිත පිරිවැජිතුමන් සමග කතිකා කරගත් පරිදි සංචාරය කළේ සැබෑ නිවන් මග දෙසනු ලබන ඇදුරුතුමකු සොයමින් ය. රජගහ නුවර දී අස්සජි මහරහතන් වහන්සේ සහ උපතිස්ස පරිබ්බාජකතුමන් අතර හමුව සිදුවන්නේ එම සංචාරයේ දී ය. එදා උපතිස්ස පිරිවැජිතුමා මහරහත් අස්සජි තෙරණුවන්ගෙන් මෙසේ විමසීය.

**"ඔබ වහන්සේ පැවිදි වූයේ කවරකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ?"**

මෙයට පිළිතුරු වශයෙන් තමන් වහන්සේගේ ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලබන ධර්මය කුමක් ද යන්න අස්සජි මහරහතන් වහන්සේ ඉතා කෙටියෙන් පැහැදිලි කළේ මෙසේ ය.

**යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ**
**තේසං ච යෝ නිරෝධෝ - එවං වාදී මහාසමණෝ**

"හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත් ද ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළ සේක. ඒ ධර්මයන්ගේ යම් නිරෝධයක් වේද එය ද දේශනා කළ සේක. මහාශ්‍රමණ වූ ඒ තථාගතයන් වහන්සේ මෙබඳු දේශනාවක් කරන්නෙකි," යනු එම ගාථාවේ අදහසයි.

මෙම දහම වටහා ගත් උපතිස්ස පරිව්‍රාජකතුමා සෝවාන් වූ බව සඳහන් වෙයි. එම පරිව්‍රාජකවරයා තුළ එබඳු සුවිශේෂ පරිවර්තනයක් සිදුවූයේ බුදු දහමේ මූලික හරය මහරහත් අස්සජි තෙරණුවන් වදාළ ගාථාවෙහි ඇතුළත් බැවිනි. එම හරය නම් **පටිච්ච සමුප්පාද ධර්මයයි.** බෞද්ධ හේතුඵල ධර්මය යනුවෙන් ද එය හැඳින්වේ. එම ධර්මතාවට අනුව ලෝකයේ **පුද්ගල, වස්තු** හා **සිද්ධි** වශයෙන් දක්නට ලැබෙන කිසිවක් ස්වාධීන බවක් නැත. තනි ක්‍රියාකාරිත්වයක් නැත. අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් තොරව, තනි තනිව ඇතිවන, තනි තනිව පවතින කිසිවක් නැත. බුදු දහමෙහි කියැවෙන්නේ යමක් ඇති වීමට තවත් දෙයක් හෝ දේවල් කීපයක් හෝ බලපාන බවයි. එසේ ඇතිවන දෙය **ඵලය** ලෙසත් ඒ සඳහා බලපාන දෙය **හේතුව** ලෙසත් හැඳින්වෙයි.

හේතු නිසා ඇතිවන සියල්ල ම නැතිවන ස්වභාවයෙන් ද යුක්ත බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. හේතු නැතිවන විට ඒ හේතු නිසා හටගත් දෑයද නැතිව යයි. **හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති...** යන්නෙන් ඉදිරිපත් කර තිබෙන්නේ එම ධර්මතාවයි.

යම් කිසිවක් හට ගැනෙන්නේ හෝ පවතින්නේ හෝ තවත් දෙයක් නිසා නම් ඒ දෙක අතර සබඳතාවක් පවතින බව පැහැදිලි ය. එය වඩාත් ම පැහැදිලි වන්නේ හට ගැනීමට හේතුවන දේ නොවන්නේ නම් එබඳු හට ගැනීමක් ද නොවන බැවිනි. එක් දෙයක හට ගැනීමට, ඇතිවීමට බලපාන්නේ යමක් ද එය **හේතුවයි.** එම හේතුවෙහි ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන දෙය, හට ගැනෙන දෙය **ඵලයයි.** එක් සිදුවීමක් සඳහා බලපාන ඊට මුලින් වන සිදුවීම හේතුවයි. එම සිදුවීම් වල අනිවාර්ය සම්බන්ධතාව නිසා ඊළඟට වන සිදුවීම ඵලයයි. මුලින් දෙය නොවිණි නම් දෙවැන්න ද නැත. මුල් සිදුවීම නොවිණි නම් පසු සිදුවීම් ද නොවේ. මෙම අන්‍යෝන්‍ය සම්බන්ධතාව පැහැදිලි කෙරෙන සුවිශේෂ ධර්ම ක්‍රමය තමයි **පටිච්ච සමුප්පාදය** වශයෙන් හැඳින්වෙන්නේ.

**පටිච්ච සමුප්පාද** යන යෙදුමෙන් ම කියැවෙන්නේ **සහේතුක බව, හේතු සහිත බව, අහේතුක නොවන බව** යන්නයි. එනම් ලෝකයේ වස්තු පුද්ගල සිද්ධි යන සියල්ලක් ම හේතු ප්‍රත්‍ය සම්බන්ධතාවකට අනුව ක්‍රියාත්මක වන බවයි. ඒ බව මතුකර පෙන්වන ධර්ම ක්‍රමය හෙවත් න්‍යාය, ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායයි. එය බුදුරජාණන් වහන්සේ විසින් ඉතාම කෙටියෙන් මෙසේ දේශනා කරනු ලැබ ඇත.

**ඉමස්මිං සති ඉදං හෝති**
**ඉමස්ස උප්පාදා ඉදං උපපජ්ජති**
**ඉමස්මිං අසති ඉදං න හෝති**
**ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති**

මෙම පාලි වාක්‍ය හතර සිංහලෙන් ලියැවෙන්නේ පහත සඳහන් පරිදි ය.

**මෙය** ඇති කල්හි **මෙය** වෙයි
**මෙය** ඉපදීමෙන් **මෙය** උපදී
**මෙය** නැති කල්හි **මෙය** නොවේ
**මෙය** නැති වී යෑමෙන් **මෙය** නැතිව යයි.

මෙම වාක්‍ය හතර දෙස බැලූ විට එක ම දෙය දෙවරක් සඳහන් වී ඇතැයි ඇතැම් විට සිතෙනු ඇත. නමුත් එය එසේ නොවන බව විමසිල්ලෙන් බලන විට පැහැදිලි වේ. පළමු වාක්‍යයේ මෙය යන්න වෙනුවට දෙවන වාක්‍යයේ සඳහන් වන්නේ **උපදියි** කියාය. තෙවන වාක්‍යයේ **නොවෙයි** යන්න වෙනුවට සිව්වන වාක්‍යයේ එන්නේ **නැතිව යයි** කියාය. පැහැදිලිව ම මෙහි එන්නේ හේතුඵල සම්බන්ධතාව දක්විය හැකි ආකාර දෙකකි. **පළමුවැන්නෙන් පැවැත්මේ සම්බන්ධතාව කියැවෙන අතර දෙවැන්නෙන් උප්පාද සම්බන්ධය කියැවේ.**

තුන සහ හතර යන වාක්‍යවල අර්ථයේ වෙනස ද ඒ අනුව තේරුම් ගත හැකි ය. පැහැදිලි කර ගැනීමේ පහසුව සඳහා භෞතික උදාහරණයක් ගනිමු. හිස් තටු දෙකක් සහිත තරාදිය සමාන්තර ව පවතී. එහි එක් තටුවක් පහත් වුවහොත් ඊට සමාන්තර ව අනෙක් තටුව එසවී පවතී. පළමු වාක්‍යයෙන් දක්වෙන්නේ එබඳු සබඳතාවකි. **තණ්හාව ඇති කල්හි දුක ඇත. තණ්හාව නැති කල්හි දුක නැත.**



උත්පාද සම්බන්ධය පැහැදිලි කිරීමට ද භෞතික උදාහරණයක් දැක්විය හැකි ය. **පහන ඉපදීමෙන් ආලෝකය උපදී.** ආලෝකය උපන්නේ පහන හෙවත් පහන් සිළුව උපන්න නිසා ය. එයින් පැහැදිලි වෙන්නේ එක් දෙයක උපත තවත් දෙයක උපතට හේතුවන බව ය. මේ අනුව ඉහත සඳහන් **ඉමස්මිං සති ඉදං හෝති...** ආදී පටිච්ච සමුප්පාද මූල සූත්‍රයෙහි පළමු වැකි දෙකින් නොපැවැත්ම හා නැතිවී යාම පිළිබඳවත් කියැවෙන බව පැහැදිලි ය.

එක් තරාදි තටුවක් පහත්ව නොතිබිණි නම් අනෙක් තටුව ඊට සමාන්තර ව උස්ව නොපවතී. පහන් සිල නූපන්නේ නම් ආලෝකය ද නූපදී. පහන නිවුණු විට ආලෝකය ද නැති වී යයි. අධ්‍යාත්මික කරුණුවල දී ද මෙම න්‍යාය ක්‍රියාත්මක වෙයි. **ක්‍රෝධය උපන් විට වෛරය උපදී. ක්‍රෝධය නිවී ගිය විට වෛරය ද සංසිඳෙයි.** මෙම සියලු සිදුවීම්වල ක්‍රියාත්මක වන **ධර්මතාව** තමයි **ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යාය** හෙවත් **පටිච්ච සමුප්පාදය** ලෙස හැඳින්වෙන්නේ. මෙම න්‍යායට අනුව සමාජ ගැටලු ඇතිවන ආකාරය සහ ඒවා විසඳා ගත හැකි ආකාරය ද තේරුම් ගත හැකි ය. බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක:

දුප්පත් අයට ධනය නොදීම නිසා දිළිඳුකම වැඩි විය.
දිළිඳුකම වැඩි වීම නිසා හොරකම වැඩි විය.
හොරකම වැඩි වීම නිසා අවි ආයුධ වැඩි විය.
අවි ආයුධ වැඩි වීම නිසා ජීවිත හානි වැඩි විය.

මේ ආකාරයෙන් දිගින් දිගට සමාජ ගැටලු ඇතිවූ අයුරු, ඇතිවන අයුරු පැහැදිලි කෙරෙන දේශනා තුළ විග්‍රහ කෙරෙන්නේ සෑම සිදුවීමක ම ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යාය ක්‍රියාත්මක වන ආකාරයයි.

මෙම න්‍යායට අනුව සමාජගත ප්‍රශ්න විමසා බැලීමට, විසඳා ගැනීමට අප පුරුදු වන්නේ නම් එය බුදු දහම ජීවිතයට සම්බන්ධ කර ගැනීමකි. මෙහෙම වුණේ ඇයි? මෙසේ සිදුවන්නේ ඇයි? යනුවෙන් නිතරම සිතින් ප්‍රශ්ණ කිරීමට අප පුරුදු විය යුතු ය. ගැටලුවක

පසුබිම තේරුම් ගත හැක්කේ එවිට ය. ගැටලුවේ සැබෑ හේතුව දුටු විට එම හේතුවට පිළියම් යෙදීමෙන් ගැටලුව නිරාකරණය කර ගත හැකි ය.


ඩෙංගු උණ බහුල වන්නේ ඇයි? ඩෙංගු මදුරුවන් බෝ වීම නිසා ය. ඩෙංගු මදුරුවන් බහුල වන්නේ ඇයි? පරිසරය අපවිත්‍ර නිසා ය. ඩෙංගු නැති කිරීමට කුමක් ද කළ යුත්තේ? පරිසරය පවිත්‍රව තබා ගත යුතු ය. පරිසරය අපවිත්‍ර නොවූ කල්හි මදුරුවන් බෝවන්නේ නැත. මදුරුවන් බෝ නොවූ කල්හි ඩෙංගු උණ සෑදෙන්නේ නැත. මේ ආකාරයට ගැටලු දෙස බැලීමට සහ ඒවා විසඳා ගැනීමට **පටිච්ච සමුප්පාදය** භාවිතා කිරීමට හුරුවෙමු.

## සාරාංශය



ලෝකයේ වස්තු, පුද්ගල, සිද්ධි වශයෙන් දක්නට ලැබෙන කිසිවක් තනිව ක්‍රියාත්මක වන්නේ නැත. සෑම ක්‍රියාවක ම, සෑම සිද්ධියක ම අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී. ඒ සම්බන්ධතාව හේතු හා ඵල වශයෙන් දක්වනු ලැබේ. අස්සජි මහරහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජිතුමාට දේශනා කරන ලද **යේ ධම්මා හේතුප්පභවා...** ආදී ගාථාවෙහි ඇතුළත් වන්නේ ද හේතුඵල ධර්මතාවයි. පටිච්ච සමුප්පාද න්‍යාය වශයෙන් දක්වෙන්නේ මෙම හේතුඵල වල අනුරූපි සම්බන්ධතාව ප්‍රකට කරන ක්‍රමයයි. එය ඉතා මැනැවින් ප්‍රකට කර තිබෙන්නේ **ඉමස්මිං සති ඉදං හෝති...** ආදී මූල සූත්‍රයෙහි ය. මෙම ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යාය ගැටලු නිරාකරණයට ද භාවිතා කළ හැකි ය.

## ක්‍රියාකාරකම



1. 'යේ ධම්මා හේතුප්පභවා.......' ආදී ගාථාවේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.
2. පටිච්ච සමුප්පාද මූල සූත්‍රය හා එහි තේරුම මතකයෙන් කියන්න.

## පැවරුම



ඔබට මතු වූ ගැටලුවක් ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යාය භාවිතා කරමින් විසඳාගෙන ඒ පිළිබඳ වාර්තාවක් පිළියෙල කරන්න